**යටියන්තොට ප්‍රාදේශීය සභාව - 2020**

**--------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

යටියන්තොට ප්‍රාදේශීය සභාවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට යටියන්තොට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරනපාර්ශවයන්ගේ වගකීම්**

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්ථාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් **විගණන** වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියාකරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයාගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම්කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබලවන්නේ ඒවා දුස්සන්ධානයෙන් ,ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශකිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරනලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරනලද සම්බන්ධිත හෙළිදරව්කිරීම් අගයන ලදී.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදකවූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත්වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයනලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කල ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියාකර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

(අ) පනතේ 6(i)(ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) පනතේ 6(i)(ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | සමාලෝචිත වර්ෂයේදී රු.3,005,000 ක් වටිනාකමැති ස්ථාවර තැන්පතුව නිදහස් කරන ලද මුදලින් යටියන්තොට සතිපොල හා පුස්තකාලය ඉදිකිරීම සඳහා වැය කරන ලද රු. 1,891,600 ක මුදල ප්‍රාග්ධන වැය ගිණුම හර කිරීම වෙනුවට සමුච්චිත අරමුදල් හා ඌනතා ගිණුමට හර කර තිබීම හේතුවෙන් වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදී ස්ථාවර තැන්පතු නිදහස් කරගැනීමේදී මෙවන් දෝෂ ඇති නොවන ආකාරයට කටයුතු කරන බව දන්වා තිබුණි. | ප්‍රාග්ධන වියදම් ප්‍රාග්ධන වැය යටතේ ගිණුම්ගත කළ යුතුයි. |
| (ආ) | වර්ෂය තුල නිෂ්පාදනය කරනු ලබන පොහොර ප්‍රමාණයේ නිෂ්පාදන පිරිවැය ගණනයකර ගිණුම්ගත කරනු වෙනුවට වර්ෂය තුල අළෙවි කරන ලද ප්‍රමාණයේ විකුණුම් වටිනාකම වූ රු. 343,471 ක් වර්ෂයේ නිෂ්පාදන තොගය ලෙස ගිණුම්ගත කර තිබුණි. | නිෂ්පාදන පිරිවැය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත කරන බව දන්වා තිබුණි. | නිෂ්පාදන පිරිවැය ගණනය කර ගිණුම්ගත කළ යුතුයි. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයකට අදාලව මූල්‍ය ප්‍රකාශන අනුව වටිනාකම රු. 11,436,630 ක් හා උප ලේඛන අනුව වටිනාකම රු. 10,764,222 ක් වූයෙන් රු. 672,408 ක වෙනසක් විය. | වසර ගණනාවක සිට ලේඛන පාලනයේ තිබූ අපැහැදිලිතාවයන් නිසා මෙම නොගැලපීම ජනනය වී ඇති බවත් මූල්‍ය ප්‍රකාශන අගය සහ සේවක ණය සත්‍ය ශේෂය ගලපා ගැනීම සඳහා 2021 වර්ෂය තුළ කටයුතු කරන බව දන්වා තිබුණි. | වෙනසට හේතු පරීක්ෂාකර නිවැරදි කර ගත යුතුයි. |

**1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම**

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු. 835,984 ක් වූ ගිණුම් විෂයයකට අදාලව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | නිසි සත්‍යාක්ෂණයක් සිදු කර සුදුසු නිරවුල් කිරීම් කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | වගකීම් පිළිබඳව තහවුරුවන ලිඛිත සාක්ෂි ඉදිරිපත් කල යුතුය. |

**1.7 අනුකූල නොවීම්**

**නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්**

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහයේ මුදල් රෙගුලාසි 371(1) | 2014 නොවැම්බර් 28 දින ග්‍රාම සංවර්ධන සමිතියකට ලබා දෙන ලද රු.137,710ක අත්තිකාරම් මුදලක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පියවා නොතිබුණි. | පළාත් සභාව වෙතින් හෝ පළාත් පාලන අමාත්‍යාංශය වෙතින් පියවා ගතයුතු මෙම ශේෂය එම ආයතන වෙතින් ලබාදුන් මඟපෙන්වීම් අනුව 2021 වර්ෂය තුලදී නිරවුල් කිරීම සිදුකරන බව දන්වා තිබුණි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |
| (ආ) | 2017 දෙසැම්බර් 13 දිනැති අංක 28 දරන නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් චක්‍රලේඛයේ (1) ඡේදය සබරගමුව පළාත්පාලන කොමසාරිස්ගේ අංක 2005/04 දරන චක්‍රලේඛය | ඉඩම් කොටස් සංවර්ධනය හා අනු බෙදීමේදී හෙක්ටයාර් 01 කට වඩා විශාල ඉඩම් වලින් ඉඩමේ විශාලත්වයෙන් ප්‍රජා හා විනෝද කටයුතු සඳහා සියයට 10 ක භූමි භාගයක් සභාව වෙත පවරා ගතයුතු වුවත් කුරහන්හේන ගල්පාත ඉඩම සහ පට්ටලඹිටියවත්ත ඉඩම් අනු බෙදීමේදී එසේ කටයුතු කර නොතිබුණි. | ගල්පාත වසම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ වන ප්‍රදේශයක් ලෙස නම් කර නොමැති නිසා පවරා ගැනීම් සිදු නොකරන ලද බවත්, සොයා බලා සුදුසු පියවර ගන්නා බව දන්වා තිබුණි. | පවරා ගැනීමට කටයුතු කළ යුතුයි. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.11,887,625 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.10,175,128 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| **(අ) වරිපනම් හා බදු** | | |
| සමාලෝචිත වර්ෂය අවසානයට පැවති වරිපනම් බදු හිඟය රු. 655,055ක් අය වී නොතිබුණි. | 2021 වර්ෂය තුල අය කිරීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| **(ආ) මුද්දර ගාස්තු** | | |
| පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2020 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුද්දර ගාස්තු හිඟ ශේෂය රු.4,979,401 ක් අය වී නොතිබුණි. | මෙම මුදල් ගෙන්වා ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අයවිය යුතු ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුයි. |
| **(ඇ) වෙනත් ආදායම්** | | |
| ක්ෂේත්‍ර පරීක්ෂාවේදී හඳුනාගත් දැන්වීම් 75 ක් සඳහා රු.186,250 ක මුදලක් අයකිරීමට කටයුතු කර නොතිබුණි. | අයහපත් සමාජ සෞඛ්‍ය තත්ත්වය හේතුවෙන් ආදායම් අයකර ගැනීම අඩුවූ අතර රු.186,250 ක මුදලින් රු.56,950 ක් අය නොකළ යුතු මුදලක් හඳුනාගෙන ඇති අතර ඉදිරි වර්ෂයේ සමීක්ෂණ කටයුතුවලදී ඉතිරි මුදල් සම්බන්ධ අයකිරීම් සිදුකර ගැනීමට කටයුතු කරන බව දන්වා තිබුණි. | අයවිය යුතු ආදායම් පසුව සංශෝධනය කිරීමේදී නිසි තහවුරුවකින් එය කළ යුතු අතර අයවිය යුතු හිඟ නොපමාව අයකර ගත යුතුයි. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව අනුමත සැලසුම් මත ඉදිකරන ලද ගොඩනැගිලි වෙනුවෙන් අනුකූලතා සහතික ලබාදිය යුතු වුවද වර්ෂ 03 ක කාලයක් තුල ගොඩනැගිලි ඉදි කිරීම සඳහා ඉදිරිපත් වූ අයදුම්පත්‍ර 120 කින් අයදුම්පත්‍ර 108 ක් අනුමතකර තිබුණද ඉදිකිරීම් අවසන් වීමෙන් පසු අනුකූලතා සහතික ඉල්ලුම් නොකිරීම හා ක්ෂේත්‍ර පරීක්ෂාවකින් එම ඉදිකිරීම් හඳුනා නොගැනීම නිසා අනුකූලතා සහතික 15 ක් පමණක් නිකුත්කර තිබුණි. | ගොඩනැගිලි සැලසුම් අනුමත කළද නියමිත කාලය තුළ ඉදිකිරීම් අවසන් නොවීම නිසා අනුකූලතා සහතික නිකුත් කිරීමේ ප්‍රමාදයක් පවතින නමුත් ඊට අදාල අවසරපත්‍රවල කාලය දීර්ඝ කිරීම සිදු කරනු ලබන බවත් මේ සම්බන්ධව විශේෂ අවධානය යොමු කර කටයුතු විධිමත් කරගැනීමට කටයුතු කරන බවත් දන්වා තිබුණි. | ඉදිකිරීම් සම්බන්ධයෙන් පනත ප්‍රකාරව කටයුතු කළ යුතුයි. |

## 3.2 නිෂ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2017 ජූනි 14 දින පළාත් පාලන හා පළාත් සභා අමාත්‍යාංශයෙන් ලැබුණු රු.6,695,000 ක් වටිනාකමැති JCB යන්ත්‍රය 2019 වර්ෂයේ සිට අක්‍රියව පැවතුනද එය අළුත්වැඩියාකිරීම ප්‍රමාද වීම හේතුවෙන් සභාවට ලැබිය යුතු ආදායම් අහිමිවී තිබූ අතර වැය දැරීමටද සිදුව තිබුණි. | ප්‍රතිපාදන සලසා ගැනීමේ ගැටලුවක් නිසා අලුත්වැඩියා කටයුතු ප්‍රමාද වූ බව දන්වා තිබුණි. | නොපමාව අළුත්වැඩියාකර සභාවේ කටයුතු සඳහා යොදාගත යුතුයි. |

## 3.3 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| රු.3,392,432ක් වැයකර ඉදි කර තිබූ යටියන්තොට මහජන පුස්තකාල ගොඩනැගිල්ල පරීක්ෂාවේදී ඉදි කරන ලද ගොඩනැගිල්ලේ පිටුපස අධික ආනතියකින් යුතු ඉවුරක් පැවතියද ඉදිකිරීම අවධානමකින් තොර බවට ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනයෙන් සහතිකයක් ලබා නොගැනීම, පළමු මහළ ඉදි කිරීම සම්බන්ධව සැලසුමක් හෝ | නව ගොඩනැල්ලේ ඉදිරි දිගු සිදුකිරීමේදී ගොඩනැගිලි පර්යේෂණ ආයතනයේ නිර්දේශය ලබා ගැනීමටත්,සභාවේ ප්‍රතිපාදන යටතේ ඉදි කිරීම සඳහා අපේක්ෂිත ගොඩනැගිලි සැලැස්ම මේවනවිට සකස් කර අවසන් කර ඇති අතර ,ඉහළ මහලේ වහල ආවරණය කිරීම ඉදිරි වර්ෂය තුළ අවසන් කිරීමට යෝජිත බවත්, ආයතනය සතු ප්‍රතිපාදන හා | ඉදිකිරීම් සිදු කිරීමේදී සැලසුම් සකස් කිරීම, අදාල ආයතනවල නිර්දේශ සහ අනුමැතීන් ලබා ගැනීම හා මුළු පිරිවැය ඇස්තමේන්තු සැකසීම සිදුකළ යුතුයි. |

| | |
|---|---|
| ඇස්තමේන්තුවක් නොතිබීම, දෙවන මහලේ වහලය ඉදිකිරීම පමා වීමෙන් නිරාවරණය වී ඇති කම්බි දිරා යාමේ අවධානමක් පැවතීම, ඉදි කිරීම සඳහා සමස්ථ ඇස්තමේන්තුවක් පිළියෙල නොකර ප්‍රජාපාදක සංවිධාන මගින් ඉදි කිරීමට හැකිවන පරිදි රු. මිලියන දෙකකට අඩු ඇස්තමේන්තු පිළියෙලකර අදියර 03 ක් යටතේ වෙන් වෙන්ව ගිවිසුම්වලට එළඹ ඉදිකිරීම් කටයුතු සිදුකිරීම හා ගොඩනැගිල්ලේ එක් පැත්තක ඉදිකරන ලද තාප්පය සඳහා ඇස්තමේන්තු සකස් නොකිරීම හා සභා අනුමැතිය ලබා නොගැනීම යනාදී කරුණු නිරීක්ෂණය විය. | ධාරිතාවය අනුව අදියර 03ක් යටතේ සිදු වුවද ඉදිකිරීමේ ගුණාත්මකභාවය ආරක්ෂාවන ආකාරයට කටයුතු කර ඇති බවත් හා තාප්පය කඩිනමින් ඉදිකිරීමට සිදුවූයේ ඉඩම් මායිම් ගැටළුවට දිගුකාලීන විසඳුමක් ලෙස බවත්, මෙම වැඩ වටිනාකම මුල් ඇස්තමේන්තු වටිනාකම හා ගලපා අවිනිශ්චිත වැඩ ඒකක යටතේ කළමනාකරණය කරගත් බවත් දන්වා තිබුණි. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### පාරිසරික ගැටළු

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවේ ඝන අපද්‍රව්‍ය කළමනාකරණය යටතේ නිෂ්පාදිත කොම්පෝස්ට් පොහොර සම්බන්ධයෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවෙන් සිදුකරන ලද විශ්ලේෂණ වාර්තාව අනුව පරීක්ෂාකරන ලද සංඝටක 09 න් 04 ක තිබිය යුතු අගයන් ඉක්මවා තිබීමෙන් නිෂ්පාදනය කරන ලද තොග ප්‍රමිතිගත තත්ත්වයට ගෙන ඒමට අවශ්‍ය පියවර ගෙන නොතිබුණි. | කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මක තත්වය අත්කර ගැනීමට ප්‍රමාණවත් වෘත්තීයභාවයක් සභාව සතු නොවීම නිසා පෙන්වා දෙන ලද දුර්වලතාවය සිදුවී තිබුණද නිෂ්පාදිත කොම්පෝස්ට් පොහොරවල ගුණාත්මකභාවය පවත්වාගැනීමට කෂිකර්ම අමාත්‍යාංශය සමඟ ඒකාබද්ධ වැඩසටහනක් 2021 වර්ෂය තුළ සිදුකරන බවත් දන්වා තිබුණි. | කොම්පෝස්ට් පොහොර නියමිත ප්‍රමිතියෙන් යුතුව නිෂ්පාදනය කිරීමට කටයුතු කළ යුතුයි. |